ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි තෙවන වසර ප්‍රථම අර්ධවාර්ෂික පරීක්ෂණය - 2018 අගෝස්තු/සැප්තැම්බර්

ආර්ථික විද්‍යාව

**ECON 3141.03 / 4110 – නීතිය හා ආර්ථික විද්‍යාව**

කාලය පැය (03) තුනයි

---

මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 70 ක් ලැබේ. ප්‍රශ්න පත්‍රය A,B,C,D සහ E යනුවෙන් කොටස් 5 කින් යුක්ත වේ. ප්‍රශ්න තෝරා ගැනීම පිළිබඳ උපදෙස් එක් එක් කොටස යටතේ දී ඇත. සිංහල වචන පිළිබඳ ගැටළුවක් වේ නම් ඉංග්‍රීසි පරිවර්තනය බලන්න.

---

**A කොටස** 1. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම 5 ක් නිර්වචනය කරන්න. (ලකුණු 10)

i. නීතිය ii.ව්‍යෝහාර නීතිය iii.නීතිය පිළිබඳ න්‍යාය iv.අපරාධ නීතිය v.ඒකාබද්ධය vi.පෞද්ගලික නීතිය

**B කොටස** 2. පහත සඳහන් පද යුගලයන් අතුරින් ඕනෑම පහක වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

i. නඩු තීරණ නීතිය හා ව්‍යවස්ථාදානය (Legislation)
ii. හරවත් නීතිය හා පටිපාටිය නීතිය
iii. ලිඛිත නීතිය හා නීතියේ අනෙකුත් මූලාශ්‍ර
iv. ජාත්‍යන්තර නීතිය හා දේශීය නීතිය
v. පෞද්ගලික නීතිය හා පිළිගත් නීතිය (Public Law)
vi. ව්‍යවස්ථාපිත නීතිය හා පරිපාලන නීතිය

**C කොටස** 3. පහත සඳහන් පද යුගලයන් අතුරින් ඕනෑම පහක සබඳතා පැහැදිලි කරන්න.

(ලකුණු 10)

i. සිවිල් අයිතිවාසිකම් හා දේශපාලන අයිතිවාසිකම්
ii. ජාත්‍යන්තර නීතිය හා දේශීය නීතිය
iii. ජාත්‍යන්තර නීතිය හා පෞද්ගලික නීතිය
iv. දඩය සහ හිරගත කිරීම
v. ගිවිසුම් නීතිය හා පවුල් නීතිය
vi. අපරාධය හා සංක්‍රාම

**D** කොටස 4. කෙටි පිළිතුරු ප්‍රශ්න. ඕනෑම ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. (ලකුණු 20)

4.1. ආණ්ඩුව විසින් නීතිය පනවනු ලබන්නේ ඇයි? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

4.2 අපරාධයක් යනු කුමක්ද? අපරාධ වර්ග මොනවාද? (ලකුණු 05)

4.3 අපරාධ සහ වැරදි කිරීම් වැළැක්වීම සඳහා ගත හැකි පියවරයන් මොනවාද?(ලකුණු 05)

4.4 මධ්‍යගත සමාජීය ආයතනයක් ලෙස පවුලට තිබෙන වර්තමාන අභියෝග මොනවාද? (ලකුණු 05)

4.5 මානව හිමිකම්වල ලක්‍ෂණ මොනවාද? (ලකුණු 05)

**E** කොටස 5. විශ්ලේෂණාත්මක ප්‍රශ්න. ඕනෑම ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න. (ලකුණු 20)

5.1 සංවර්ධනය අත්පත් කර ගැනීමේ දී ව්‍යවස්ථාව කෙතරම් දුරට උපකාරීවේ දැයි විග්‍රහ කරන්න. (ලකුණු 10)

5.2 නීතිය පිළිබඳ ආර්ථික විද්‍යාත්මක විග්‍රහයෙහි මූලික පියවර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

5.3 තරගය ප්‍රවර්ධනය කිරීමෙහි දී සංගත විරෝධී නීතිය උපකාරී වන්නේ කෙසේද? පැහැදිලි කරන්න. (ලකුණු 10)

************